# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 23 දරන
## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
## (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2002 ඔක්තෝබර් මස 11 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2002 අංක 23 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 39/99.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 23 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 63 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "පදිංචිකරු විසින් එම ගොඩනැගිල්ලෙහි පදිංචිය නීත්‍යානුකූල ලෙස අවසන් කිරීමේ" යන වචන වෙනුවට "ගෙහිමියා විසින් එම ගොඩනැගිල්ලෙහි පදිංචිය නීත්‍යානුකූල ලෙස අවසන් කිරීමේ" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. *1979 අංක 17 දරන පනතේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියේ "අධිකාරියේ යම් දේපළක්, කටයුත්තක් සහ යම් ක්‍රියාකාරකමක්" යන වචන වෙනුවට "අධිකාරියේ යම් දේපළක්, කටයුත්තක් සහ යම් ක්‍රියාකාරකමක් හෝ එම දේපළ, කටයුත්ත හෝ ක්‍රියාකාරකම සම්බන්ධයෙන් යම් නඩු කටයුත්තක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "1972 අංක 7 දරන ගෙවල් කුලී පනත." යන අයිතමයට ඉක්බිතිව ම "1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත." යන අයිතමය එකතු කිරීමෙන් උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.*

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.